**බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය**
**මධ්‍යම සංස්කෘතික අරමුදල**
**ජාතික අනුරූ පාසල**
බටලීය - පස්යාල

## කෞතුක වස්තු අනුරූ නිර්මාණ සහතික පත්‍ර හා ඩිප්ලෝමා පුහුණු වැඩසටහන් සඳහා සිසුන් බඳවා ගැනීම -2026
## (2026-2028 අධ්‍යයන වර්ෂය)

චිත්‍ර/මූර්ති/ලී කැටයම්/ගල් කැටයම්/සෙරමික්/පිත්තල වාත්තු හා කැටයම්, යන විෂයන් පිළිබඳ උසස් අධ්‍යාපනයක් අපේක්ෂා කරන, දක්ෂතා ඇති තරුණ තරුණියන් ඉලක්ක කර ගනිමින් සැකසුණු සහතික පත්‍ර හා ඩිප්ලෝමා පුහුණු වැඩසටහන් සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.
(ජාතික අනුරූ පාසල වෘත්තීය පුහුණු ආයතනයක් ලෙස තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ (TVEC) අංක P02/0561 යටතේ ලියාපදිංචි වී ඇත.)

**පුහුණු වැඩසටහන් කාලය ඃ අවුරුදු 02යි මාස 06 කි.**
(වසර 02 ක පුහුණුවකින් පසුව මාස 06 ක කාලයක් අනුරූ නිර්මාණ කාර්යයට යොමු කරනු ඇත.)
(සෙනසුරාදා හා ඉරිදා හා රජයේ නිවාඩු දිනයන් හැර සෑම සතියේ දිනකම පෙ.ව.8.30 සිට පස්වරු 4.00 දක්වා පන්ති පැවැත්වේ)

**විෂය නිර්දේශයේ අන්තර්ගතයන්** ඃ කෞතුක වස්තු අනුරූ නිර්මාණයට අදාලව සහතික පත්‍ර හා ඩිප්ලෝමා වැඩසටහනට පහත සඳහන් විෂයයන් ඇතුලත් වේ.

**මූර්ති (මැටි ඇඹීම)/චිත්‍ර/පිත්තල වාත්තු හා කැටයම්/ලී කැටයම්/සෙරමික්/ගල් කැටයම්** ප්‍රධාන විෂයන් වශයෙන්ද, එම විෂයන්ට අදාල වෙනත් ව්‍යවහාරික කලාවන් උප විෂයන් වශයෙන්ද අධ්‍යයන කටයුතු සිදු කරනු ලැබේ.

**පාඨමාලා මාධ්‍යය ඃ** **සිංහල**
**පාඨමාලා පැවැත්වෙන ස්ථානය ඃ බටලීය - පස්යාල පිහිටි ජාතික අනුරූ පාසල**
**පාඨමාලා ඇරඹීම ඃ** 2026 මාර්තු මස
**තෝරා ගැනීම ඃ** 2026 මාර්තු මසදී සම්මුඛ පරීක්ෂණයකින් හා ප්‍රායෝගික පරීක්ෂණයක් මගින් සිදු කෙරේ.
**පාඨමාලා ගාස්තු හා පහසුකම් ඃ** පාඨමාලාව සඳහා ගාස්තු අය නොකරන අතර දෛනිකව රු.500.00 බැගින් වූ දීමනාවක් මාසිකව ආයතනය මගින් සිසුන් වෙත ලබා දෙනු ලැබේ. (මාසිකව 80% පැමිණීම අවශ්‍ය වේ.)
පාඨමාලාව හදාරන කාලය තුලදී අවශ්‍ය මූලික අමුද්‍රව්‍ය මධ්‍යම සංස්කෘතික අරමුදල මගින් සපයනු ලබන අතර,

අධ්‍යයන කටයුතු සඳහා එක් එක් විෂයන්ට අවශ්‍ය අතිරේක අමුද්‍රව්‍ය හා පෞද්ගලික ආම්පන්න/උපකරණ පමණක් සිසුන් විසින් සපයා ගත යුතුය.
මධ්‍යම සංස්කෘතික අරමුදල මගින් නිල ඇඳුම් සපයන අතර ඒ සඳහා යන වියදමින් අඩක් සිසුන්ගෙන් අය කරනු ලැබේ.

**අයදුම්කරුවන්ට තිබිය යුතු සුදුසුකම්ඃ**

- 2026.03.01 දිනට වයස අවුරුදු 18 - 30 අතර
  හා
- අ.පො.ස.(සා.පෙළ) සඳහා **චිත්‍ර** හා **සිංහල** විෂයයන් සමත් වී තිබීම
- අ.පො.ස.(සා.පෙළ) චිත්‍ර විෂය සඳහා සම්මාන සාමාර්ථයක් ලබා තිබීම හෝ අ.පො.ස.(උ.පෙළ) සඳහා චිත්‍ර විෂය හදාරා තිබීම විශේෂ සුදුසුකමක් සේ සැලකේ.
- **සාම්ප්‍රදායික කලාකරුවන්ගේ දරුවන් සඳහාද මේ සඳහා අයදුම් කළ හැකි අතර, මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම අත්‍යාවශ්‍ය නොවේ.** (ඔවුන් පාරම්පරික කලා පවුලක සාමාජිකයෙකු බව තහවුරු කල යුතු අතර ග්‍රාම සේවක, සාමදාන විනිශ්චකාර, පූජ්‍ය ප්‍රධානීන්, සහතික කරන ලද ලිපි ප්‍රාදේශීය ලේකම් විසින් තහවුරු කල යුතුය.)
  පාඨමාලාව සඳහා ඇතුලත් කළ සියලුම විෂය කොටස් අධ්‍යයනය සම්පූර්ණ කරන සිසුන්ට පමණක් අනුරූ නිර්මාණ සහතික පත්‍ර හා ඩිප්ලෝමා සහතික පත්‍රය නිකුත් කරනු ලැබේ.

**සැලකිය යුතුයි** ඃ විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා තෝරාගෙන ඇති හෝ වෙනත් රාජ්‍ය/පෞද්ගලික ආයතනයක පූර්ණ කාලීන පාඨමාලා සඳහා ලියාපදිංචි වී ඇති අය මේ සඳහා සුදුසුකම් නොලබයි.

**අයදුම්පත් ඃ** තමා විසින් සකස් කරගන්නා ලද අයදුම්පත්‍රයක් සම්පූර්ණ කර එය බහාලන කවරයේ වම් පස ඉහළ කෙලවරේ ''**ජාතික අනුරූ පාසලට සිසුන් බඳවා ගැනීම - 2026**'' යන්න සඳහන් කර 2026.03.15 දින වන විට ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.

**අයදුම්පත් එවිය යුතු ලිපිනය** ඃ- **ස්ථානභාර නිලධාරී,**
**මධ්‍යම සංස්කෘතික අරමුදල ,**
**ජාතික අනුරූ පාසල,**
**බටලීය, පස්යාල**

**අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය - 2026.03.15**
**තොරතුරු ලබා ගැනීමට** ඃ- ස්ථානභාර නිලධාරී - 033-2285230 / අධ්‍යයන අංශය - 033-2284107

පුහුණු වැඩසටහන සාර්ථකව නිම කරනු ලබන සිසුන් සඳහා මධ්‍යම සංස්කෘතික අරමුදල මගින් සහතික පත්‍ර හා ඩිප්ලෝමා සහතික පත්‍රයක්ද ඊට අමතරව ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය මගින් සහතිකයක් ද පිරිනැමෙනු ඇත.

- **මෙම විස්තරය 2026.02.13 දින දිනමිණ, ඩේලිනිව්ස් හා තිනකරන් යන පුවත්පත් වල පල කර ඇත.**